# අඩු මිලකට කලට වේලාවට බලමාධ්‍යයන් සැපයිය යුතුයි

ශ්‍රී ලංකාවේ ගොවිපළ බලය සහ ජල පාච්චිය අළලා කොළඹ ක්‍රම උපදේශක ජේ. පැරින්ග්ටන් (රෙඩිං විශ්ව විද්‍යාලය – බ්‍රිතාන්‍යය) සහ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී ටෙරන්ස් අබේසේකර විසින් සළ කරනා ලද වාර්තාවකින් සැකසිණි.

ට්‍රැක්ටර් අයිතිකරුවන් ගෙන් ප්‍රයෝජනයක් මුළුමහත් ගොවි ජනතාවටම පොදුවේ අත්වේ යයි බලාපොරොත්තු විය හැක්කේ විශේෂ අවස්ථාවන්හි දී පමණි. නිෂ්පාදනය කෙරෙහි බලපාන සාධකයන්ට සම්බන්ධ පෞද්ගලික අයිතිය සුළු පිරිසක් අත රැඳී පවත්නා කල්හි සෙසු ජන කොටසට ඵල ප්‍රයෝජනයක් අත්වනවා නම් අත් වනුයේ ඔවුන්ට අවශ්‍ය කුලී සේවාවන් සඳහා අය කෙරෙන ගාස්තු තරඟකාරිත්වයත්, කාර්යක්ෂමතාවත් තුළින් පහත් මට්ටමක පැවතුනහොත් පමණි. කෘෂිකාර්මික බල මාධ්‍යයන් පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කරන කල්හී කුලී ගාස්තු ප්‍රමාණයන් ප්‍රමාණවත් ලාභයක් ඉපැයීම සඳහා අය කළයුතු ප්‍රමාණයට වඩා ඉතා අධික වන බව අපට කිව හැකි ය. කුලී සේවාවන් බලාපොරොත්තු වන්නා වූ, එහෙත්, එතරම් වත් පොහොසත් කමක් නොමැති විශාල පිරිසක් සූරා කෑමට ගොදුරු කෙරෙමින් ට්‍රැක්ටර් අයිතිකරුවන් අතර මතුවෙන අකාර්යක්ෂමතාවයත් ඒකාධිකාරී ක්‍රියා පටිපාටියත් මෙහි දී පෙන්නුම් කෙරෙයි. මෙම ක්‍රියාවලිය ට්‍රැක්ටර් කුලියට ගන්නන්ට පමණක් බලපාන්නක් ද නොවේ. නඩත්තු වියදම්වල සමානුපාතී වැඩිවීමක් හෝ නොමැතිව, ට්‍රැක්ටර් කුලී ගාස්තු වැඩි වෙන ආකාරයට මී හරක් කුලිය ද වැඩි කිරීමට මී හරක් අයිතිකරුවන් පෙළඹෙන බව සාමාන්‍ය නිරීක්ෂණය කදී පෙනී යයි. ප්‍රතිඵලය, ජන සමූහයේ ඉතාමත් දිළිඳු කණ්ඩායම්වල එනම්, මී හරකුන් කුලියට ගෙන ගොවිතැන් බත් කිරීමට බලාපොරොත්තු වන්නන් ගේ, මුදලින් අතිරික්ත වශයෙන් ලාභ ඉපැයීම ය.



ට්‍රැක්ටරයක්, හරක් බානක් අපට ඕනෑ වෙලාවට සොයා ගන්න එක ලේසි වැඩක් නොවෙයි.

වගා කටයුතු වඩාත් වේගවත් කිරීමට ට්‍රැක්ටරය ඉවහල් වෙන නිසා ට්‍රැක්ටර් හිමියන්ට ඔවුන් ගේ ගොවිපළවල් පාලනයෙහි දී සැළකිය යුතු තරමේ වාසිදයක තත්ත්වයක් අත් වෙන අතර, ඔවුන් ගේ අක්කර ප්‍රමාණය වැඩි කර ගැනීමට ද

එය තුඩු දෙයි. නුමුත්, ට්‍රැක්ටර් හිමියන් සතු ඉඩම් ප්‍රමාණය පුළුල් කර ගැනීමෙහිලා මූලික වශයෙන් හේතු සාධක වනුයේ ට්‍රැක්ටර් කුලී කිරීමෙන් අත් කර ගනු ලබන ලාභයයි. අවුරුදු කිහිපයකට කලින් පවත්වන ලද සමීක්ෂණයන්හි දී පෙනී ගිය ආකාරයට කුලියට සී සෑම විශාල වශයෙන් ලාභ ඉපැයීමේ මඟකි. මෑතකදී ආනයන පාලන නීති ලිහිල් කිරීම ට්‍රැක්ටර් සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවීමට හේතුවී ඇත. ට්‍රැක්ටර් මිල මෙන් ම ඉන්ධන මිල ද එසේම ඉහළ ගොසිණි.

ට්‍රැක්ටර් වැනි බෙදිය නොහැකි විශාල සම්පතක් මෙන් ම මී හරක් පාලනය වැනි විශාල වශයෙන් ඒක රාශී වූ අයිතීන් සහිත ක්‍රම ද පවත්නා බැවින් හිඟ බල යෙදවුම් වැඩි දෙනෙකු අතරේ බෙද හද ගත හැකි ප්‍රධානතම මාර්ගය කුලී කිරීම ය. දැනටමත් වත් පොහොසත් කම් ඇති අය විසින් අතිරේක ලාභ ඉපැයීම, කුලියට සේවා වන් ලබා ගැනීමට කැමැති අය සඳහා ප්‍රමාණවත් තරමින් අවශ්‍ය සේවාවන් සැපයීමට අපහසුවීම සහ සැපයෙන කුලී සේවාවන් සඳහා අධික ගාස්තු අය කිරීම වැනි අනර්ථකාරී ප්‍රතිඵල අකාර්යක්ෂම පාලනය, ඒකාධිකාරී ස්වභාවය ආදී හේතූන් නිසා ඇති වීමට පුළුවන. නිෂ්පාදනයට වඩාත් උචිත බල මාධ්‍යයන් පිළිබඳවත්, රැකියා ඉඩකඩ ආදියට බලපාන කරුණු පිළිබඳවත්, යොද ගත හැකි වෙනත් විකල්පයන් සඳහා වැය වෙන ගාස්තු ආදිය පිළිබඳවත්, එසේම, ගොවීන්ට ලබා ගැනීමට ඇති ජල හා බෝග නිෂ්පාදන යෙදවුම් ආදිය පිළිබඳවත් පුළුල් අවබෝධයකින් යුතුව ගොවීන්ට අවශ්‍ය බල මාධ්‍යයන් කලට වේලාවට අඩු මිලකට සැපයීම පිණිස ආණ්ඩුවේ ප්‍රතිපත්තීන් සකස් කළ හැකි ය.

# පහන් වැට

* මිනිසෙකුට තමා ජය ගැනීමට හැකි නම් එය එවරස්ට් තරණයට ද වඩා ශ්‍රේෂ්ඨ ක්‍රියාවකි.
  – ඉලි ජේ. ෂ්ලේසිපර් –

* හානා හීය පානා අඩ සැරෙන් දනේ.
  – සිංහල පිරුළක් –

* තනිව යන්නා හට අදම ගමන පටන් ගත හැකි ය. එහෙත් තවෙකෙකු කැටුව යන්නා හට ඒ තැනැත්තා ද සූදනම් වන තුරු බලා සිටීමට සිදු වන්නේ ය.
  – හෙන්රි ඩේවිඩ් තොරෝ –

* බඩගින්න සනහන ඕනෑම දෙයක් හොඳ ආහාරයකි.
  – චීන පිරුළක් –

* සියළු කල්හි අඩක් නිවැරදිව සිටිනවාට වඩා අඩක් කල්හි මුළුමනින් ම නිවැරදිව සිටීම උතුම් ය.
  – මැල්කම් ෆෝබ්ස් –

* ඔබේ පසුම්බියෙහි මුදල් තියෙන තුරා ඔබ ඥානවන්තය, ඔබ දැකුම්කළුය, එසේම ඔබ හොඳින් ගීත ගායනා ද කරන්නෙහි ය.
  – යුදෙව් පිරුළක් –

* බොහෝ සේ කතා කරන්නන් දෙදෙනකුට දුර ගමනක් එකට යා නොහැකිය.
  – ස්පාඤ්ඤ පිරුළක් –